00730

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 5වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU5354- ප්‍රාථමික ඉගැන්වීම් සඳහා සෞන්දර්ය**

කාලය - පැය දෙකයි. (02)

දිනය - 2025.06.13 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. "නිර්මාණශීලීත්වය සංවර්ධනය වන්නේ අත්දැකීම් සහ ඉගෙනීම් තුළින් මිස මිනිසුන්ට උපතින්ම ලැබෙන දෙයකින් නොවේ." සෞන්දර්ය අධ්‍යාපනය තුළින් සිසුන්ගේ නිර්මාණාත්මක සංවර්ධනය සඳහා පායලට උදව් කළ හැකි ආකාරය උදාහරණ දෙකක් (02) සමඟ සාකච්ඡා කරන්න.

02. ප්‍රාථමික අධ්‍යාපනය තුළ හොඳින් සැලසුම් කරන ලද පන්ති කාමර පරිසරයක් සිසුන්ගේ සෞන්දර්යාත්මක අත්දැකීම් වැඩිදියුණු කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. කුඩා දරුවන්ගේ චිත්තවේගීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේදී සෞන්දර්යාත්මක අධ්‍යාපනයේ කාර්යභාරය උදාහරණ දෙකක් (02) සමඟ පරීක්ෂා කරන්න.

04. ප්‍රාථමික අධ්‍යාපනය තුළ පරිකල්පනය සංවර්ධනය කිරීම සඳහා නාට්‍ය හා රංග කලාව භාවිත කරන්නේ කෙසේද? ඔබෙ කරුණු නිදර්ශනය කිරීමට උදාහරණ භාවිත කරන්න.

05. ළමා චිත්‍ර වල එක් එක් සංවර්ධන අවධි වල ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.

06. ගුරුවරයෙක් ලෙස, ළමා චිත්‍ර සංවර්ධනය සඳහා, සහාය සහ උත්තේජක පරිසරයක් නිර්මාණය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

07. ප්‍රාථමික පන්ති කාමර වල නර්තන ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග මොනවාද?

08. ප්‍රාථමික පන්ති කාමරයේදී ගණිත සංකල්ප ඉගැන්වීමට ඔබ සංගීතය සහ චලනය සමෝධානය කරන්නේ කෙසේද? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

ලකුණු 05 X 08 =40



41

## 02 - වන කොටස

09. I. නාට්‍ය හා රංග කලාවේ "නම්‍යශීලීත්වය" යන සංකල්පය විස්තර කරන්න. (ලකුණු 08 )

II. නාට්‍ය හා රංග කලාව ප්‍රාථමික විෂය මාලාවට සමෝධානය කිරීමේ බලපෑම පහත මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.

a) සිසුන්ගේ අභිප්‍රේරණය (ලකුණු 04 )

b) රසවින්දනය (ලකුණු 04 )

c) සමස්ත ඉගෙනීමේ නියැලීම (ලකුණු 04 )

10. I. පහත මාතෘකා ගවේශනය කිරීම සඳහා ළමා චිත්‍ර මාධ්‍යයක් ලෙස භාවිත කල හැකි ආකාරය සාකච්ඡා කරන්න.

a) ස්වයං ප්‍රකාශන මාධ්‍යයක් ලෙස (ලකුණු 04 )

b) සන්නිවේදන මාධ්‍යයක් ලෙස (ලකුණු 04 )

II. "චිත්‍ර ඇඳීම, ප්‍රාථමික පාසල් සිසුන්ගේ නිර්මාණශීලීත්වය සහ ප්‍රකාශන හැකියාව සංවර්ධනය කිරීමේ ප්‍රධාන ක්‍රියාකාරකමක් ලෙස සැලකේ." චිත්‍ර ඇඳීමේ ක්‍රියාවලිය හරහා සිසුන් අත්කර ගන්නා සංවර්ධනයේ අංශ පරීක්ෂා කරන්න. (ලකුණු 12 )

11. I. සංගීතය සහ චලන ක්‍රියාකාරකම් වලින් කුඩා ළමයින් අත්කර ගන්නා කායික සංවර්ධනය සම්බන්ධ ප්‍රතිලාභ සාකච්ඡා කරන්න. සුදුසු ක්‍රියාකාරකම් සමඟ උදාහරණ සපයන්න. (ලකුණු 10 )

II. සංගීතය සහ චලන ක්‍රියාකාරකම් සඳහා සහයෝගී පරිසරයක් නිර්මාණය කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග මොනවාද? එම අභියෝග ජය ගැනීමට ඔබට කළ හැක්කේ මොනවාද? (ලකුණු 10 )

12. I. ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය මඟින් කුඩා ළමයින් තුළ සෞන්දර්යාත්මක අගය කිරීම ප්‍රවර්ධනය කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

II. සංගීත බුද්ධිය විස්තර කර ප්‍රාථමික පාසල් ගුරුවරුන්ට පන්ති කාමරය තුළ මෙම බුද්ධිය සංවර්ධනය කළ හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

13. I. ප්‍රාථමික ශ්‍රේණියක ඕනෑම පාඩමකින් තේමාවක් තෝරා ගන්න. සෞන්දර්යාත්මක සහ නිර්මාණාත්මක සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් 3ක් ඇතුළත් පාඩම් සැලැස්මක් සකස් කරන්න. පහත මාර්ගෝපදේශ භාවිත කරන්න.

ශ්‍රේණිය, විෂය, තේමාව, නිපුණතාවය, ඉගෙනුම් ඵල, පාඩම් ප්‍රවේශය, ඉගැන්වීමේ ආධාරක, පියවර සහ තක්සේරුව (ලකුණු 10 )

II. "කුඩා ළමයින් නර්තන ක්‍රියාකාරකම් වලට සම්බන්ධ කර ගැනීමෙන් සමාජ සංවේදිතාව සංවර්ධනය කළ හැක." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 10 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*



49